ආයතනයේ නම - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මාතලේ

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நிறுவனத்தின் பெயர்- மாவட்ட செயலகம், மாத்தளை

பாராளுமன்றத்தின்அரச கணக்குகள் தொடர்பான குழு சமர்பித்த அறிக்கைகள் தொடர்பாக நிலையியற் கட்டளை இல 119(4) ன் கீழ் கௌரவ அமைச்சரினால் மேற்கொள்ளப்பட்ட அவதானிப்புகள் மற்றும் மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகளை பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Name of the institution - District Secretariat Matale

Submission of observations of hon. Minister and steps taken with regard to the reports tabled by the committee on public Accounts of standing order No.119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 183

ආයතනයේ නම - මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

| කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු | අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග |
| --- | --- |
| වාහන ගර්හිත වී මාස 6 වඩා අඩු කාලයකදි අපහරණය කර නොතිබුණි. | විෂය මූලික වූ අංක **53-7240** දරන වාහනය **2021 09.06** දින වෙන්දේසි කර එහිවෙන්දේසි වටිනාකම වන රු.**1,426,000.00** මුදල රජයේ ගිණුමට බැර කරන ලදි.<br><br>මෙ දක්වා නියමිත කාලසීමාව තුල ගර්හිත නොකල වාහන කිසිවක් නොමැත. |
| මු.රෙ.**94(1)** ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි. | **2020** වර්ෂයේ සිදු වූ වරදක් වන අතර **2021** වර්ෂයේ දි තිබුණු ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ නොතිබුනි.<br><br>**2022** වර්ෂයේදි ද තිබුණු ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ නොතිබුනි. |
| අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබුණි. | අනුමත සීමාව තුල කාර්යය මණ්ඩල පවත්වා ගැනීමට අදාළ ස්ථාන මාරුවීම් සිදු කරන ලද අතර අත්‍යවශ්‍යතාවය මත නව තනතුරු ඇති කිරිම සඳහා කටයුතු කර ඇත.<br><br>රියදුරු, කාර්යාල කාර්යය සහයක, කළමනාකරණ සේවා නිලධාරි සීමාව තුල පවත්වා ගෙන යනු ලබයි.<br><br>අධිසේවක පදනම මත බඳවා ගෙන ඇති සහකාර අධ්‍යක්ෂ නව තනතුරක් ඇති කිරීම සඳහා කළමනාකරණසේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් යොමු කර ඇත.<br><br>භාෂා පරිවර්තක සිංහල - දෙමළ තනතුරක් අහෝසි කර ඉංග්‍රිසි - සිංහල තනතුරක් ඇති කිරිම සඳහා කළමනාකරණ සේවා |

| | |
|---|---|
| | රජයේ ප්‍රතිපත්තිමය තීරනයක් මත බඳවා ගෙන ඇති සංවර්ධන නිලධාරින් ගේ පමණක් අතිරික්තයක් පවතින අතර ඉදිරියේදි රජය විසින් දෙනු ලබන තීරණයක් මත කටයුතු කරන ලැබේ. |
| විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබු අඩු පාඩු/දෝෂ නිවැරදි කරවා ගෙන නොතිබුණි. | විගණන විමසුම් මගින් පෙන්වා දි ඇති කරුනු සම්බන්ධයෙන් සියළුම ප්‍රාදේශීය ලේකම් වරු දැනුවත් කර ඇති අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරි වෙත අභ්‍යන්තර නියෝග මගින් දැනුවත් කර ඇත.<br><br>දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් කාර්තුමය වශයෙන් පවත්වනු ලබන විගණන කළමනාකරණ කමිටු මගින් විගණනයට ලක් වු සියළු ක්ෂේත්‍ර පිළිබද කාරණා සාකච්ඡා කර මින් ඊට අදාළ ක්‍රියා මාර්ග ගනු ලබයි. එමෙන්ම අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කර විගණනය විසින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කර ඇද්ද යන්න අධික්ෂණය කරනු ලැබේ. |

..........................................

දිස්ත්‍රික් ලේකම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

මාතලේ.

තේජානි තිලකරත්න
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
මාතලේ

..........................................

ප්‍රධාන ගණකාධිකාරි

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

මාතලේ

එම්.ඒ. ප්‍රියංග බිලපිත්
ප්‍රධාන

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
ස්වදේශ කටයුතු අංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග මගින් 2023 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ලඟාකර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)
අග්‍රාමාත්‍යතුමා සහ
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍ය.